# සංස්කෘතයෙන් ආභාසය ලත් පුරාතන සිංහල සාහිත්‍යය

බෝතලේගම සංඝරතන හිමි
B. A, M. A, අධ්‍යාපන ඩිප්ලෝමා
බු.ශ්‍රා. ධ. පි. බෞද්ධ සංස්කෘති අංශයේ කථිකාචාර්ය

ක්‍රි. ව: පළමු වන ශතවර්ෂයේ අවසාන භාගයේදී දඹදිව පුරුෂ පුරයෙහි රජ කළ කණිෂ්ක රජතුමාගේ අනුග්‍රහය යටතේ මහායානිකයන් විසින් 4 වන ධර්ම සංගායනාව පවත්වන ලදී. එහිදී මහායාන ධර්මය ලේඛනගත කරවා දේශාන්තරවල ප්‍රචාරය කිරීම සඳහාද කටයුතු සැලැස්වූහ. එම ධර්මය ලේඛනගත කළේ සංස්කෘත භාෂාවෙනි. ලංකාවේ වළගම්බා රජ දවස මහාවිහාරීය සහ අභයගිරි භික්ෂූන් අතර ඇති වූ මතභේදයේ ප්‍රතිඵලයක් වශයෙන් මේ අවදියේ ලංකාවටද මහායාන ධර්මය පැමිණි අතර එම ධර්මය පිළිගත් අභයගිරි භික්ෂූහු සංස්කෘත භාෂාව හැදෑරීමට උත්සුක වූහ. එහෙත් ඊට පෙර ආර්යයන් ලංකාවට පැමිණි මුල් කාලයේ පටන්ම ලක්වැසියා සංස්කෘත දැන සිටින්නට ඇතැයි සිතිය හැකි සාධක හමු වී තිබේ. ඒ දක්වාම එය පැවතියේ බ්‍රාහ්මණයින්ගේ ඒකාධිකාරයක් වශයෙනි. පණ්ඩුකාභය වැනි රජුන් හට පණ්ඩුල වැනි බමුණන් ඇදුරන් ලෙස පෙනී සිටීම නිදසුන් වශයෙන් දැක්විය හැකිය.

අභයගිරි භික්ෂූන් මහායාන ධර්මය පිළිගැනීම නිසා සිදු වූ එක් දෙයක් නම් සංස්කෘත භාෂාව වැඩි වැඩියෙන් ජනප්‍රිය භාවයට පත්වීමයි. එය හැම අතින්ම පරිපෝෂිත භාෂාවක් වූ හෙයින් කල් යාමේදී මහාවිහාරවාසී ථේරවාදී භික්ෂූන්ටද එය නොහදරා සිටිය නොහැකි විය. ඒ හේතුවෙන් සංස්කෘත භාෂාව සිංහල සාහිත්‍ය ග්‍රන්ථවලට මෙන්ම කලාශිල්ප, ආචාර විචාර ඇදහිලි, පුදපූජා ආදියටද විශාල බලපෑමක් ඇති කිරීමට සමත් විය. මෙහිදී අපේ අවධානය යොමු වනුයේ පුරාතන සිංහල සාහිත්‍යය සංස්කෘතයෙන් ආභාසය ලත් බවට සාධක ලෙස දැක්විය යුතු ස්ථාන කීපයක් විමසා බැලීම පමණකි.

සිංහල සාහිත්‍ය ග්‍රන්ථාවලියේ අපට මුලින්ම හමුවනුයේ ක්‍රි. ව. 10 ශතවර්ෂයේ දී අනුරාධපුරයෙහි රජ කළ ' සලමෙවන් ' රජතුමා විසින් රචනා කරන ලද ' සියබස්ලකර ' නම් අලංකාර ග්‍රන්ථයයි. ක්‍රි. ව.7 සියවසේ ඉන්දියාවේ විසූ ' දණ්ඩී ' නම් ආලංකාරිකයාගේ සංස්කෘත ' කාව්‍යාදර්ශය ' ගුරුකොට ගෙන රචනා කර ඇති මෙය හුදු පරිවර්තනයකට සමානය.

සියබස්ලකරෙහි

' මුනිවිරු සව්සතර - නොනසීවී සබාව්
එසෙම නොහො සියුරු - නෙත් පවතී අදද ළෙහිමා

යන 382 වෙනි ගීයට මුල්වූ පද්‍යය කාව්‍යාදර්ශයේ සඳහන් වන්නේ මෙසේය.

'සත්‍ය මෙවාහ සුගතඃ - සංස්කාරානවිනාශ්වරාන්
තථාහිමාංචකෝරාක්ෂි - ස්ථිතෛවාද්‍යාපි මෙ හෘදි ' (316)

අලංකාර වාදය සංස්කෘත කාව්‍ය ජීවිතයට විශේෂයෙන්ම අවශ්‍යවූවක් වෙයි. අලංකාරයෙන් තොරවූ වාක්‍යවල සෞන්දර්යයක් නැත. කාව්‍යයක් නම් එය අලංකාරයක් විය යුතුමය. එම අලංකාරය දෝෂයන්ගෙන් පරිබාහිර විය යුතුයි. සිංහල අලංකාර ශාස්ත්‍රය පිළිබඳව අවබෝධයක් ලබාදීමට රචිත සියබස්ලකර සිංහල සාහිත්‍යයට ඇති උසස්ම අලංකාර ග්‍රන්ථය වන අතර එය සංස්කෘතයේ ආභාසය නිසාම සිංහල සාහිත්‍යයට එක් වූ ග්‍රන්ථයකියි පැවසිය හැක. සියබස්ලකරට අනතුරුව සිංහල සාහිත්‍යයට එක්වුණු V කාශ්‍යප රජතුමන් විසින් කළ දම්පියා අටුවා ගැටපදය වද සංස්කෘතයේ ආභාසය තරමක් හෝ ලැබී ඇති බව පෙනේ. මෙය ඛුද්දක නිකායට අයත් ධම්මපදයට බුද්ධඝෝෂ හිමියන් විසින් ලියන ලද ධම්මපදට්ඨ කථාවේ ගැඹුරු පාලි වචනවලට ලියන ලද ගැටපද විවරණයකි. කතුවරයා ප්‍රකාශ කරන්නේ මෙය සත්‍යයක් බවයි.

අභාසලමෙවන් කසුබ් මහරජහු දහම්පියා අටුවාවට කළ සත්‍යයයි ' . යන පාඨයෙන් ඒ බව ප්‍රකට වෙයි. මේ සත්‍යය යන වචනය සිංහලට හෝ පාලියට අයත් වචනයක් නොව සංස්කෘතයෙහි දක්නට ලැබෙන්නකි. ඉතාම පැරණි සිංහල වචන ඇතුලත් මේ ග්‍රන්ථයෙහි ධම්මපදට්ඨකථාවේ ආරම්භක ගාථාවන්ගේ ගැඹුරු වචනවලට අර්ථ සපයා ඇත. ධම්මපදයේ වර්ග 26 කට අයත් කථා වස්තු 350 ට සම්බන්ධ ගැටපදයන්ගේ අර්ථවිවරණ දක්වා ඇති මෙය සංස්කෘත ' භාෂ්‍ය ' ග්‍රන්ථයකට සමාන කළ හැක. එබැවින් දම්පියා අටුවා ගැටපදය බහුශ්‍රැත පඬිවරයෙකු විසින් සංස්කෘතයේ ආභාසය ලැබ සිංහල සාහිත්‍යයට එක් කරන ලද තවත් එක් වටිනා ග්‍රන්ථයක් ලෙස දැක්විය හැක.

දම්පියා අටුවා ගැටපදයට අනතුරුව අනුරාධපුර යුගයෙහි ලියවුණු අනෙක් උසස්ම සිංහල සාහිත්‍ය කෘතිය වනුයේ ' සිඛවළඳ හා සිඛවළඳ විනිස ' යි. මෙය විනය ග්‍රන්ථයකි. සමන්තපාසාදිකා, මූල සික්ඛා-ඛුද්දක සික්ඛා යන විනය පොත් ආශ්‍රයෙන් රචිත 'සිඛවළඳ' සිංහලයෙන් විනය නීති සඳහන් වී ඇති ග්‍රන්ථයකි. එයට ලියූ විවරණය සිඛවළඳ විනිසයි. මේ නම් දෙක එකතු කර සිඛවළඳ හා සිඛවළඳ

විනිස යයි ග්‍රන්ථයට නම දී ඇත. උපසම්පද භික්ෂූන් සඳහා විශේෂයෙන්ම මෙය රචනා කර ඇති බව සතර පාරාජිකා, සතර සඝාවශේෂ තුදුස් නිසගි, එක්සාලිස් පචිති ප්‍රකීර්ණක කොටසක් සහ පොහෝ පවුරුණු විනිසක් ද ඇතුළත් කර තිබීමෙන් පෙනේ.

මෙහි සඳහන් 'සඟවෙසෙස්' ශබ්දය භාෂාරීති අනුව සථවිරවාදීන්ගේ 'සංඝාදිසෙස' යන ශබ්දයෙන් ප්‍රභවය වූවක් නොවන බව පෙනේ. එය වඩාත් සමීප වනුයේ සර්වාස්තිවාදීන්ගේ 'සංඝාවසෙස' යන පදයටය. එම නිසා 'සිඛවළඳ' සර්වාස්තිවාදී භික්ෂුවක් විසින් රචනා කරන්නට ඇති බව සිතිය හැකි අතර එම නිසා එයටද සංස්කෘතයේ ආභාසය ලැබෙන්නට ඇතැයි සිතේ.

සිංහල සාහිත්‍යයට අයත් පැරණිම පද්‍ය විශේෂය 'ගී' නමින් හඳුන්වනු ලැබේ. අනුරාධපුර යුගයට අයත් සීගිරියෙහි ලියා ඇති 'ගී' ක්‍රි. ව. 8. 9. 10 ශත වර්ෂවලදී රචනා කරන්නට ඇති බවට සාධක ඇත. සීගිරියෙහි අඳින ලද වනිතාවන්ගේ සිතුවම් දැක අනුරාගයෙන් කුල්මත් වූ කලා රසිකයන් විවිධ මාතෘකා වලින් රචනා කර ඇති ඒවා සිංහලයන්ගේ අතීත ශ්‍රී විභූතියත් ඔවුන්ගේ සහජ කවිත්වයත් කලා රුචිකත්වයත් පෙන්නුම් කරයි. එසේ රචිත ගී 685 ක් පමණ දක්නට ඇත. ඒවා ලියූ ඇතැම් කවියන්ද සංස්කෘත සාහිත්‍යයේ ආභාසය ලබා ඇති බවට ඇතැම් ගී දෙස් දෙයි.

වන්දිම් හිමිවලා - තොගොසින් ඇය නිවෙස්නට
පිරිබුන් පගා මලසුන-දිවොට තො හදහවකියු කියයි. (42)

යන ගීය රචනා කළ කවියා එය ලිවීමට කාලිදාසයන් විසින් රචනා කරන ලද සංස්කෘත මේඝදූතයේ ආභාසය ලබන්නට ඇති බව පෙනේ. මොහු මේඝදූතයේ එන ආකෘතිය සැලකිල්ලට ගෙන සීගිරි ලලනාවන්ට පෙම්පත් ලියා ඇති ආකාරයත් ඉන් පැහැදිලි වේ. සීගිරි 'ගී' වල දක්නට ලැබෙන විශිෂ්ට වූ අලංකාරයන්ගෙන්ද පෙනෙන්නේ ඒවා කෙරෙහි නොමඳව සංස්කෘතයේ ආභාසය ලැබී ඇති බවයි.

ක්‍රි. ව. 1017 පොළොන්නරු යුගයේ ආරම්භය වශයෙන් සලකනු ලැබේ. අනුරාධපුර යුගයටත් වඩා සිංහල සාහිත්‍ය විෂයෙහි සංස්කෘතයේ ආභාසය ලත් යුගයක් මෙන්ම ගද්‍ය-පද්‍ය සිංහල සාහිත්‍ය කෘතිවලින් දියුණු වූ යුගයක් ලෙසද පොළොන්නරු යුගය හැඳින්විය හැක. මේ යුගයේ ගිහි-පැවිදි පඬිවරු බොහෝ දෙනෙක් ද වාසය කළහ. දිඹුලාගල කාශ්‍යප, වාචිස්සර-ධර්මකීර්ති ආදී පැවිදි පඬිවරු ද ගුරුළුගෝමී, විද්‍යාචක්‍රවර්ති වැනි උසස් ගිහි පඬිවරු ද ඒ අතර වූහ. ඔවුන්ගෙන් ඇතැමෙක් පාලි සාහිත්‍යයෙන් ආභාසය ලැබ සිංහල ග්‍රන්ථ රචනා කර ඇති අතර සමහරෙක් සංස්කෘතයෙන් ආභාසය ලබා ග්‍රන්ථ රචනා කළහ. මෙසේ රචිත ග්‍රන්ථ අතුරින්

1. අමාවතුර
2. ධර්මප්‍රදීපිකාව
3. බුත්සරණ
4. සඟසරණ
5. දම්සරණ
6. සසද වත

යනාදී ග්‍රන්ථ විශිෂ්ට ගණයෙහිලා සැලකිය හැකි අතර ඒවා රචනා කිරීමේදීද සංස්කෘතයේ ආභාසය නොමඳව ලැබී ඇති බවට කරුණු සොයාගත හැකිය.

මෙයින් අමාවතුර හා ධර්මප්‍රදීපිකාව ගුරුළුගෝමීන් විසින් රචිත කෘති දෙකකි. ධම්ප්‍රදීපිකාව ඔහුගේ මුල්ම කෘතියයි. එහි බොහෝ තැන්වල සංස්කෘත ග්‍රන්ථයන්ගෙන් උපුටා ගන්නා ලද සංස්කෘත පද්‍ය දක්නා ලැබේ. ද්වේෂයෙහි සහ ක්ෂමාවෙහි තත්වය දක්වනු පිණිස ශාන්තිදේවයන්ගේ බෝධිචර්‍යාවතාරයෙන් සංස්කෘත පද්‍ය දෙකක් උපුටා දක්වා ඇති අතර සුරාපානයේ දොස් දක්වනු පිණිස නිදසුන් කළ;

යාම්පිවන්තො මද ලුප්ත සංඥා
වෘෂ්ණ්‍යාන්ධකා විස්මෘත බන්ධු භාවාඃ
පරස්පරං නිෂ්පිපිෂූර් ගං හි-
රුන්මාදනී සා නිහිතෙන කුම්භෙ

යන ශ්ලෝකය ආර්‍යශූරපාදයන්ගේ ජාතක මාලාවෙන් උපුටා ගන්නා ලද්දකි.

තවද ගුරුළුගෝමීන්ගේ අමාවතුරෙහි ධනපාල ඇතු බුදුන් වෙත පැමිණීම විස්තර කරන තැනදී පාදපංකජස්තවයේ

ගණ්ඩස්ථලී ලුඨිත දානමශීනිෂේක
භ්‍රාන්තෝන්නදද් භ්‍රමර මණ්ඩල ඩිණ්ඩිමෙන
ක්‍රොධෝෂ්මණා හිදයතා ධනපාලකෙන
පාදද්වයෙ ප්‍රණාමායී ධෘතාංකුශෙනෙ
යන ශ්ලෝකය උපුටා දක්වමින් එහි සිංහල භාවයද මෙසේ දක්වා ඇත.

' මෙසේ කපොලත්හි පැහැර මද දැලි මුසුව බමර මවුලු හඬව බෙර ඇති කෝගිනින් දිලිසෙන යුගත් ගිනිකඳ මෙන් යන ධනපාලවා විසින් ඔවුන් අකුසු සියෝ මගුලි ලකුණු පිරිවර ලත්සත් ලකුණෙන් විසිතුරු දෙපත්ලෙහි බැස හෙව වදනා ලද '

බුත්සරණ - දම්සරණ හා සඟසරණ යන ග්‍රන්ථ තුනම රචනා කළ විද්‍යාචක්‍රවර්තිද ඒවා රචනා කිරීමේදී සංස්කෘත පොත්වල ආභාසය ලබා ඇති බව ඒවා පරීක්ෂා කිරීමේදී පෙනී යයි. මරගනත්ගේ අදහස් හා රූප සෞන්දර්යය වර්ණනා කරන විද්‍යාචක්‍රවර්තීන් බුත්සරණේදී දක්වා ඇති.

' වසත් කලෙක සුපිපි ලිය මඩුවෙක '

යන කොටස ලලිතවිස්තරයෙහි එන, ' සුවසන්තකෙ සෘතුවර ආගතකෙ රම්මෝ ප්‍රිය පුලලිත පාද පංකෙ' යන කොටසට සමානය.

' මෙදුප්පත් තොප මිඩියත් '

ආදී කොටස

' ප්‍රේක්ෂති නාථ ඉමා තවදායි තිකාම් '

ආදී පද්‍යයට සමාන වේ. තවද බුත්සරණේ එන මරගනත්ගේ වර්ණනාවද ලලිතවිස්තරයේ මරගන වර්ණනාව හා ගැළපේ. ඒ අනුව විද්‍යාචක්‍රවර්තීන් විසින් රචිත බුත්සරණට සංස්කෘතයේ ආභාසය ලැබී ඇති බව පැහැදිලි වන අතර සෙසු ග්‍රන්ථ දෙකටද සංස්කෘතය බලපාන්නට ඇතැයි විශ්වාස කළ හැක.

මේ යුගයේදීම සිංහල සාහිත්‍යයට එක්වුණු සසදාවතෙහිද සංස්කෘතයෙන් ලත් ආභාසය දැක ගත හැක. එහි එන ' සාදුකින් බොදුනට' යන පද්‍යය සංස්කෘත ව්‍යාඝ්‍රී ජාතකයේ සාරාංශයකි.

සේගජකුළ දැක ' ආදී පද්‍යයද ආර්යශූරපාදයන්ගේ ජාතකමාලාවේ ' සෙට්ඨහත්ථි ' ජාතක කථාවේ සාරාංශය දැක්වීමකි.

මෙසේ බලන කල පොළොන්නරු යුගයෙහි ලියවුණු සිංහල සාහිත්‍ය ග්‍රන්ථ කෙරෙහිද සංස්කෘතයේ ආභාසය ලැබී ඇති බව පෙනේ. ඊට කලින් හෝ පසුව නොවූ විරූ අයුරින් මේ යුගයේදී එය බලපා ඇත.

සංස්කෘතය වෛතුල්‍යවාදීන්ගේ ග්‍රන්ථ භාෂාව වූ හෙයින් ථෙරවාදය ආරක්ෂා කර ගැනීම සඳහා සංස්කෘත භාෂාව පිටුදැකීමේ විශාල ව්‍යාපාරයක් රජවරුන්ගේ ද සහයෝගය ඇතිව මහාවිහාරීය භික්ෂූන් වහන්සේලා විසින් ආදිකාලයේ ගෙනගිය බව පෙනේ. ඒ කෙබඳු බාධක තිබුණත් ලංකාවෙන් සංස්කෘත භාෂාව අතුගා දැමීමට කවරෙකුටවත් සමත් නොවුන. ලංකාවට බුදු දහම පැමිණීමටත් පෙර සිට සිංහලය කෙරෙහි මඳ වශයෙන් බල පෑ සංස්කෘතය මහායාන බුදධාගමේ පැමිණීමෙත් පසු වර්ධනයවී අද දක්වාත් එසේම පැවතගෙන එයි. ඒ සියල්ල විස්තර වශයෙන් දැක්වීම මෙවැනි ලිපියකින් අපහසුය.

---

ආශ්‍රිත ග්‍රන්ථ


සියබස් ලකර

කාව්‍යා දර්ශය

ද්ම්පියා අටුවා ගැටපදය

අමාවතුර

පැරණි සිංහල සාහිත්‍යය


* Habit is greater than the nature
ජම්මෙට වඩා පුරුද්ද ලොකුයි.

* We all have hopes, dreams and ambitions, but achieving them of course is a very big struggle.
අප සැමට සිහින, සිතුම් පැතුම්, ආශාවන් ඇතත් ඒවා ළඟාකර ගැනීම එතරම් පහසු නොවේ.